# කම්කරු දෙපාර්තමේන්තුව

# කොළඹ 05

## සේවක අර්ථසාධක අරමුදල් අංශයේ සේවාවන් සැපයීමට අදාළව ජාලකරණ කටයුතු සිදුකිරීම සඳහා සේවා සපයන්නන් ලියාපදිංචි කිරීම - 2024

## ගොනු අංකය - FG/TB/06/2022

කම්කරු දෙපාර්තමේන්තුවේ සේවක අර්ථසාධක අරමුදල් අංශයේ සේවාවන් සැපයීමට අදාළව සහ දිවයින පුරා පිහිටි කලාප, දිස්ත්‍රික් හා උප කම්කරු කාර්යාලයන්හි ජාලකරණ කටයුතු සිදුකිරීම සඳහා සැපයුම්කරුවන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

සේවා සැපයුම්කරුවන් වෙතින් මේ සඳහා මිල ගණන් කැඳවනු ලැබේ.

**<u>ලියාපදිංචිය සඳහා තිබිය යුතු සුදුසුකම්.</u>**

1. අයදුම්කරුවන් හට වලංගු ව්‍යාපාර ලියාපදංචි සහතිකයක් තිබිය යුතුවේ.
2. මේ සඳහා උනන්දුවක් දක්වන පාර්ශවයන්ට රජයේ ආයතනයන්හි ජාලකරණ කටයුතු පිළිබඳ අවම වශයෙන් වසර 03ක පළපුරුද්දක් තිබිය යුතු අතර අදාළ කාර්යය ප්‍රදානය කිරීමෙන් අනතුරුව උප කොන්ත්‍රාත් කරුවන් වෙත පැවරීම සිදුනොකළ යුතු වේ.
3. ඔබ ආයතනය සේවා සැපයුම්කරුවෙක් ලෙස තෝරාගනු ලැබුවහොත් අවම වශයෙන් දින 30 ක ණය කාලසීමාවක් ලබාදීමට හැකියාව තිබිය යුතුවේ.

**<u>අයදුම්පත්‍රය සමඟ ඉදිරිපත් කළයුතු ලේඛන</u>**

1. නිසිපරිදි සම්පූර්ණ කරනු ලැබූ අයදුම්පත්‍රය
2. ලියාපදිංචිය සඳහා මුදල් ගෙවනු ලැබූ කුවිතාන්සිය
3. සහතික කරනු ලැබූ වලංගු ව්‍යාපාර ලියාපදංචි සහතිකයේ පිටපතක්
4. ආයතනය ලියාපදිංචි සමාගමක් නම් සංස්ථාපිත සහතිකය
5. VAT සඳහා ලියාපදිංචි වී තිබේනම් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරනු ලැබූ VAT ලියාපදංචි සහතිකය

6. පසුගිය වසර 03 තුළ (2021,2022,2023) රජයේ ආයතන /පෞද්ගලික ආයතන වෙත සිදුකරනු ලැබූ ජාලකරණ කටයුතු වලට අදාල ගැණුම් ඇණවුම්/ඉන්වොයිස් පත් වල සහතික කරනු ලැබූ පිටපත්

<u>අයදුම්පත් යොමු කළ යුතු ආකාරය</u>

1. මේ සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන සේවා සැපයුම් කරුවන් රු.1000.00 ක ආපසු නොගෙවන ලියාපදිංචිවීමේ ගාස්තුවක් ගෙවිය යුතුය.අයදුම්කරුවන් විසින් කම්කරු දෙපාර්තමේන්තුවේ මෙහෙවර පියස ගොඩනැගිල්ලේ 09 වන මහලේ පිහිටි මුදල් අංශයේ සරප් කවුන්ටරය වෙත 2023.12.15 දින ප.ව.3.00 දක්වා මුදලින් පමණක් ගෙවීම් සිදු කළ හැකිවේ.
2. මුදල් ගෙවූ කුවිතාන්සිය අයදුම්පත්‍රය සමඟ අමුණා "සේවක අර්ථසාධක අරමුදල් අංශයේ සේවාවන් සැපයීමට අදාළව ජාලකරණ කටයුතු සිදුකිරීම සඳහා සේවා සපයන්නන් ලියාපදිංචි කිරීම - 2024" ලෙස ලිපි කවරයේ වම්පස ඉහළ කෙලවරේ සඳහන් කර 2023.12.15 දිනට පෙර ලැබෙන පරිදි සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,මුදල් අංශය, 9 වන මහල, මෙහෙවර පියස ගොඩනැගිල්ල, කම්කරු දෙපාර්තමේන්තුව, කොළඹ 05 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් භාරදීම හෝ සිදු කළ යුතුවේ. අසම්පූර්ණ හා නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

3. ආදර්ශ අයදුම්පත් දෙපාර්තමේන්තු වෙබ් අඩවිය www.labourdept.gov.lk වෙත පිවිස හෝ කොළඹ 05, මෙහෙවර පියස ගොඩනැගිල්ලේ 09 වන මහලේ පිහිටි මුදල් අංශයේ ප්‍රසම්පාදන ශාඛාව වෙතින් ලබාගත හැකි වේ.

4. සේවා ලබා ගැනීමේදී ලියාපදංචි සේවා සැපයුම්කරුවන් වෙතින් මිල ගණන් කැඳවනු ලබන අතර ඒ සඳහා සේවා සැපයුම්කරුවන් තෝරා ගැනීමේ පූර්ණ අයිතිය කම්කරු දෙපාර්තමේන්තුව සතු වේ.
5. තවද සේවා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ අයදුම්පත් භාර ගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීමේ හෝ සම්පූර්ණ බලය කම්කරු දෙපාර්තමේන්තුව සතුවේ. අසම්පූර්ණ ලිපිලේඛණ ඉදිරිපත් කිරීම අයදුම්පත්‍රය ප්‍රතික්ෂේප වීමට හේතු වේ.
6. වැඩිදුර විස්තර දුරකථන අංක 0112104837 මගින් ගණකාධිකාරී (ප්‍රසම්පාදන) වෙතින් ලබාගත හැකිවේ.

කම්කරු කොමසාරිස් ජනරාල්

කම්කරු දෙපාර්තමේන්තුව